**කැලණිය අධ්‍යාපන කලාපය**

**දෙවන වාර පරීක්ෂණය - 2016**

**කතෝලික ධර්මය**

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම :-.............................................................................

විභාග අංකය :- ........................................

ශ්‍රේණිය :- 10 ............... කාලය පැය :- 03

---

## 1 කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. ශු. බයිබලය ලේඛනගත වූ කාලය වන්නේ,
1) ක්‍රි.ව. 700 - ක්‍රි.ව. 950
2) ක්‍රි.පූ. 100 - ක්‍රි.පූ. 950
3) ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100
4) ක්‍රි.පූ. 922 - ක්‍රි.ව. 100

02. දේව වචනය ලේඛනගත වීමට පෙර පරම්පරාවෙන් පරම්පරාවට දහම රැගෙන ගියේ
1) පූජක සම්ප්‍රදාය තුළිනි.
2) වාචික සම්ප්‍රදාය තුළිනි.
3) යාවිස්ත සම්ප්‍රදාය තුළිනි.
4) එලොහිස්ත සම්ප්‍රදාය තුළිනි.

03. පැරණි ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා යෙදෙන නාමය වනුයේ, (හෙබ්‍රෙව් නාමය)
1) හොක්මා
2) අක්කායා
3) නෙයුමා
4) සෙප්තුවාජින්ත

04. අත් අඩංගුවට ගත් ජේසුස් වහන්සේව මුලින්ම රැගෙන ගියේ,
1) ජෙරුසලම් දේව මාලිගාව වෙතය.
2) නාසරත්හි සිනගෝගය වෙතය.
3) උත්තම පූජකයාගේ මැඳුර වෙතය.
4) පොන්සියුස් පිලාත්ගේ මැඳුර වෙතය.

05. ඩොමීෂියස් අධිරාජ්‍යයාගේ පීඩන සමයේ ලියන ලද නව ගිවිසුමට අයත් ග්‍රන්ථය වනුයේ,
1) දානියල්ගේ පොත
2) එළිදරව්ව පොත
3) ජෝබ්ගේ පොත
4) ධර්මදේශකයාගේ පොත

06. ජේසුස් වහන්සේගේ මෘත ශරීරය භූමිදාන කිරීමට මුලික වූයේ,
1) සීමොන් සිරනේවුස්ය.
2) ජුවාම් අපෝස්තුළුවරයාය
3) නීතිධරයකු වූ නිකදේමුස්ය.
4) අරිමතියාවේ ජෝශප්ය.

07. ශුද්ධ බයිබලයේ අඩංගු නොවූවද සභාවේ ඉගැන්වීම් වලට අදාළ වෙනත් කරුණු ලබාගන්නේ කුමන මූලාශ්‍රයෙන් ද?
1) වාචික සම්ප්‍රදායෙන් ය.
2) අසම්මත ග්‍රන්ථ වලින්ය.
3) ද්විතීය නීති සංග්‍රහයෙනි.
4) ජීවන සභා සම්ප්‍රදායෙනි.

08. ජනප්‍රිය ඉතිහාස කෘතියකි.
1) වීරාවලිය
2) රුත් කථාව
3) ගීතාවලිය
4) එස්රා

09. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇත්තේ ග්‍රීසියේ ................. නම් ස්ථානයේ ක්‍රි.ව. 80 - 90 අතර කාලයේ ය.
1) ඇතන්ස් 2) අක්කායා 3) අන්තියෝකය 4) එපියස්

10. එළිදරව්ව සාහිත්‍යයේ 10 සංඛ්‍යාවෙන් සංකේතවත් වන්නේ
1) පරිපූර්ණත්වය 2) පූර්ණත්වය 3) දස පණත 4) ගෝත්‍ර ගණන

11. පැරණි ගිවිසුම තුළ ප්‍රඥාවන්තම රජු ලෙස පිළිගනු ලබන්නේ,
1) සලමන් රජ 2) දාවිත් රජ 3) හෙරෝද් රජ 4) රෙහෙබෝවම් රජ

12. "දෙවියන් වහන්සේ මැවිල්ලේ ස්වාමියාණෝය." මේ බව දක්වන්නේ ශු. බයිබලයේ .............. පොතෙහිය.
1) නික්මයාම 2) ගීතාවලිය 3) උත්පත්ති 4) එළිදරව්ව

13. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වූ සලකුණක් නොවන්නේ,
1) ගින්දර 2) සුළඟ
3) අන්‍යභාෂා කථනය 4) ඝන අන්ධකාරය

14. උපස්ථායක ස්තේපන් තුමාගේ අවසානය සිදුවූයේ,
1) ගල් ගසා මරා දැමීමෙනි. 2) කුරුසියේ ඇණ ගැසීමෙනි.
3) හිසගසා දැමීමෙනි. 4) සිරගත කිරීමෙනි.

15. දිවැසිවරයා යන්නට යෙදෙන ග්‍රීක වදන වනුයේ,
1) ප්‍රොෆේටේස් 2) නබි 3) මතේටේස් 4) තියෝපිලස්

16. මහා බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ ගෝලයන්ගේ පාද සේදූ බව සඳහන් වන සුවිශේෂය වනුයේ,
1) මාර්ක් සුවිශේෂය 2) ලූක් සුවිශේෂය
3) මතෙව් සුවිශේෂය 4) ජොහාන් සුවිශේෂය

17. තෙරේසා මව්තුමිය හඳුන්වනු ලබන ගෞරවනීය නාමයකි,
1) ජීවමාන සියල්ලන්ගේ මාතාව 2) ජීවමාන සාන්තුවරිය
3) අසරණයන්ගේ මාතාව 4) මුඩුක්කුවේ සාන්තුවරිය

18. ජුදා සිනගෝගයකට හා මුස්ලිම් පල්ලියකට වැඩම කළ පළමු ශුද්ධෝත්තම පියතුමා වනුයේ,
1) පළමුවන පියුස් ශුද්ධෝත්තම පියතුමා
2) දහතුන්වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
3) දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
4) විසිතුන්වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා

19. "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානයේ නිර්මාතෘවරයා වනුයේ,
1) දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා 2) ගරු මයිකල් රුදිගු පියතුමා
3) මැක්සිමිලියම් කෝල්බේ පියතුමා 4) ශු. තෙරේසා මුනිවරිය

20. පැරණි ගිවිසුමේ සියලු යාග ................ මගින් පූර්ණත්වයට පත්විය.
1) කල්වාරි යාගය 2) සීනායි ගිවිසුම 3) සත්ව බිලිපූජා 4) දවන පූජා

21. විශ්වාසයේ ජීවිතයක් සඳහා අපට ආදර්ශයකි.
1) නෝවා 2) මරියතුමිය 3) සකරියස් තුමා 4) එළිසබෙත් තුමිය

22. ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධාන අරමුණ වනුයේ,
1) ජනතාවට බුද්ධිය හා ප්‍රඥාව ලබාදීමට
2) ජනතාවගේ ජීවිත නිවැරදි කිරීමට
3) ජනතාවට ධර්මිෂ්ඨ හා නිවැරදි දිවියකට මහදැක්වීමට
4) ජනතාවගේ ජීවිත බලාපොරොත්තු ඉටුකරලීමට

23. එළිදරව්ව සාහිත්‍යයේ සංකේතයක් වන මකරා යන සංකේතයේ අර්ථය වනුයේ,
1) යක්ෂයා ය.
2) ක්‍රිස්තුන් වහන්සේය.
3) අන්ත ක්‍රිස්තුය.
4) මායාකාරී බලවේගය

24. "ඔබ ක්‍රිස්තුවරයාණෝය. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය." යනුවෙන් ජේසුස් වහන්සේට පිළිතුරු දුන්නේ,
1) පාවුළුතුමා
2) ජොහාන් තුමා
3) පේදුරු තුමා
4) තෝමස් තුමා

25. ශුද්ධවූ සභාවේ ලක්ෂණ අතරට නොගැළපෙන පිළිතුර වනුයේ,
1) ඒකත්වය
2) ශුද්ධත්වය
3) කතෝලිකත්වය
4) සදාතනිකත්වය

26. දිළිඳු ජනතාවගේ අයිතිවාසිකම් රැකදීමට මූලික වූ මෙතුමා වතු කම්කරුවන් උදෙසා ද හඬ නැගීය.
1) ජුසේවාස් මුනිතුමා
2) ගරු මයිකල් රුදිගු පියතුමා
3) මර්සලින් ජයකොඩි පියතුමා
4) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා

27. පළමු පණතට විරුද්ධ ක්‍රියාවක් නොවන්නේ,
1) සාස්තර ඇසීම
2) අංජනම් බැලීම
3) නැකත් බැලීම
4) බාරහාර ඉටුකිරීම

28. මවට ද පියාට ද ගෞරව කරන්නාට ලැබෙන විපාකය වන්නේ,
1) කීර්තිය ප්‍රශංසා හිමි වීම
2) ධනය බලය ලැබීම
3) දීර්ගායුෂ ලැබීම
4) කෙත්වතු සරුසාර වීම

29. බොරුවට දිව්රීම හා දෙවියන්ගේ නාමය අනිසි ලෙස භාවිත කිරීම නිසා අප කඩකරන්නේ කුමන පණත ද?
1) පළමු පණත
2) දෙවන පණත
3) තුන්වන පණත
4) හතරවන පණත

30. ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ධර්මදූත කණ්ඩායම වනුයේ,
1) ප්‍රැන්සිස්කාන ධර්මදූතවරු
2) ජේසු නිකායික ධර්මදූතවරු
3) අගුස්තීනු නිකායික ධර්මදූතවරු
4) දොමිනිකාන ධර්මදූතවරු

31. ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කතෝලික දහම රැක ගැනීමට මූලික වූ ජුසේවාස් පියතුමා අයත් නිකාය වනුයේ,
1) අගුස්තීන නිකාය
2) වින්සෙන්තියාන නිකාය
3) නිර්මල මරිය නිකාය
4) ඔරතෝරියාන නිකාය

32. දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩනැගීමට පුරෝගාමී වූයේ,
1) දොන් පීටර් පිල්ලේ පියතුමා
2) මර්සලින් ජයකොඩි පියතුමා
3) මිගෙල්ද මෙල්ලෝ පියතුමා
4) ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා

33. අපෝස්තුළුවරයා යන්නෙහි තේරුම
1) යවනු ලැබූ තැනැත්තා
2) දෙවියන් වහන්සේගේ මිත්‍රයා
3) තෝරාගනු ලැබූ තැනැත්තා
4) දෙවියන් වෙතින් පැමිණෙන්නා

34. "මොවුන් ගැන පමණක් නොව මොවුන්ගේ වචනය කරණකොටගෙන මා අදහාගන්නා අය ගැනත් යාච්ඤා කරමි." මෙසේ සඳහන් වන්නේ,
1) කන්ද උඩ දේශනාවේය.
2) උත්තම පූජක යාච්ඤාවේය.
3) මරියාවන්ගේ උදාන ගීතයේය
4) මල් උයනේ යාච්ඤාවේය.

35. පාවුළුතුමාගේ දෙවන ධර්මදූත චාරිකාවේදී එක්වූ පුද්ගලයන් වනුයේ,
1) බර්ණබස්, සීලස් හා ලූක් තුමා
2) බර්ණබස්, සීලස් හා මාර්ක්
3) සීලස්, තිමෝතියස් හා ලූක් තුමා
4) තිමෝතියස්, සීලස් හා මාර්ක්

36. "අන්‍යජාතීන්ගේ අපෝස්තුළුවරයා" ලෙස නම් කරනු ලබන්නේ,
1) ශු. ජාකොබ් තුමාව
2) ශු. ජොහාන් තුමාව
3) ශු. පේදුරු තුමාව.
4) ශු. පාවුළු තුමාව

37. ශුද්ධවූ සභාවට ඇතුළු වූ පළමු විජාතිකයා වනුයේ,
1) ශතාධිපති කොරනේලියුස්
2) සිමියොන් නම් විජාතිකයා
3) දේශාධිපති සර්ගියස් පාවුලස්
4) එතියෝපීය නපුංසකයා

38. එළිදරව්ව පොතේ සඳහන් වන "මම අල්පා හා ඔමෙගාය" මෙහි තේරුම වනුයේ,
1) මම ආරම්භය හා පටන්ගැන්ම ය.
2) මම පළමුවැන්නා හා අන්තිමයා ය.
3) මම අවසානය හා අන්තිමයා ය.
4) මම ස්වාමියාණෝ හා දෙවිඳාණෝ ය.

39. පවිකමා කිරීමේ බලය අපෝස්තුළුවරුන් වෙත දානය කළේ ........................ දින දීය.
1) මහා බ්‍රහස්පතින්දා
2) මහා සිකුරාදා
3) පාස්කු ඉරිදා
4) පෙන්තකොස්ත

40. "මාගේ ස්වාමිනි මාගේ දෙවියනී" යනුවෙන් තම විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කළේ,
1) ශු. පේදුරු තුමා
2) ශු. ජොහාන් තුමා
3) ශු. පාවුළු තුමා
4) ශු. තෝමස් තුමා

# II කොටස

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01) 1. පුරාණ ගිවිසුමට අයත් ඉතිහාස පොත් ගණන කීයද?
2. බැබිලෝනිය විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ ප්‍රතිස්ථානය පිළිබඳව සඳහන් වන ඉතිහාස පොත් දෙක නම් කරන්න.
3. දේව වචනයේ මූලාශ්‍ර දෙක නම් කරන්න.
4. පුරාණ ගිවිසුමට හා නව ගිවිසුමට අයත් එළිදරව්ව සාහිත්‍යයේ කෘති නම් කරන්න.
5. ශුද්ධවූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා හා අපෝස්තුළුවරුන්ගේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා නම් කරන්න.
6. පේදුරුතුමාගේ මහා ප්‍රකාශනය ලියා දක්වන්න.
7. ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ කළ වහල් සේවාවන් දෙකක් ලියන්න.
8. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් නම් කරන්න.
9. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දේව ප්‍රේමයට විරුද්ධ පව් දෙකක් දක්වන්න.
10. මහ බ්‍රහස්පතින්දා දින ජේසුස් වහන්සේ සිදුකළ විශේෂ කාර්යයන් දෙකක් ලියන්න.

02) 1. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ හතරක් නම් කරන්න.
2. ප්‍රඥාවේ ප්‍රභේද තුනක් දක්වන්න.
3. "ප්‍රඥාව ශුද්ධාත්ම දීමනාවකි." එහෙයින් ප්‍රඥාව ඉල්ලා ශුද්ධාත්මයාණන්ට යාච්ඤාවක් පිළියෙල කරන්න. (පේළි 8)

03) 1. ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගත්පසු මුහුණ දුන් විනිශ්චයන් දෙකක් ලියන්න.
2. ජේසුස් වහන්සේ උත්ථානයෙන් පසු දර්ශනය වූ අවස්ථා තුනක් දක්වන්න.
3. නව අහස හා නව පොළවට ඇතුළු වීමට සුදුස්සකු වීමට ඔබ කරන ක්‍රියා පහක් දක්වන්න.

04) 1. ශු. පාවුලුතුමාගේ ජීවිතයේ අවසානය කෙසේ සිදුවීද?
2. ආරුඪ කර්තෘත්වයට අයත් පාවුළු සංදේශ තුනක් නම් කරන්න.
3. ශු. පාවුලුතුමා සභාවේ වර්ධනයට (පැතිර යාමට) දායක වූ ආකාර පහක් ලියන්න.

05) 1. ශුද්ධවූ සභාවේ ආරම්භක දිනය හා ස්ථානය දක්වන්න.
2. බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි පැවිදි නිකායයන් තුනක් දක්වන්න.
3. "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකිය." යනුවෙන් ජුසේවාස් පියතුමාගේ අවසන් ඔවදනින් ඔබගේ ජීවිතයට ලැබෙන මඟපෙන්වීම් පහක් ලියන්න.

06) 1. එළිදරව්ව සාහිත්‍ය තුළ සංකේත භාවිතයේ පරමාර්ථ දෙක දක්වන්න.
2. එළිදරව්ව සාහිත්‍යය තුළ යොදාගෙන ඇති වර්ණ සංකේත තුනක් දක්වා ඒවායේ අරුත ලියන්න.
3. පීඩන සමයේ කිතු දහම රැකගැනීමට ජුසේවාස් පියතුමා ගත් උත්සාහය අගයමින් පේළි 10 ක පමණ විස්තරයක් කරන්න.

07) 1. පාස්කු අභිරහස යනු කුමක්ද?
2. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග තුනක් දක්වන්න.
3. නව ගිවිසුමේ පාස්කු භෝජනය වන දිව්‍ය යාගයට අර්ථවත් ව සහභාගී විය හැකි ක්‍රම පහක් ලියන්න.

08) කැමති මාතෘකා දෙකක් තෝරාගෙන පේළි 10 බැගින් විස්තර කරන්න.
1. පුරාණ ගිවිසුමේ පූද පූජා
2. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා
3. ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතුදහම
4. ශුද්ධවූ පේදුරු තුමා
5. නව ගිවිසුමේ පෙන්තකොස්ත මංගල්‍යය